**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.01.20 පැය 1410 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 101 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු**</u>

## 01. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියන් සිව්දෙනෙකු අත්අඩංගුවට - කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය.

2025.01.20 වන දින අළුයම් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ කොළඹ 14 සහ ග්‍රෑන්ඩ්පාස් ප්‍රදේශයේදී කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරු මත වැටලීම් 03 ක් සිදු කර **අයිස් ග්‍රෑම් 01 මිලිග්‍රෑම් 920 ක්, අයිස් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 750 ක් හා අයිස් ග්‍රෑම් 24 මිලිග්‍රෑම් 790 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියන් තිදෙනෙකු** අත්අඩංගුවට ගෙන ග්‍රෑන්ඩ්පාස් පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරියන් අවුරුදු 24, 35 සහ 38 වයස්වල පසු වන කොළඹ 14 සහ මීතොටමුල්ල ප්‍රදේශවල පදිංචිකාරියන් වේ.**

අත්අඩංගුවට ගත් සැකකාරියන්ගෙන් සිදුකරන ලද ප්‍රශ්න කිරීමේදී, සංවිධානාත්මක අපරාධ කල්ලි සාමාජිකයෙක් හා මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකුගේ සමීප කාන්තාවක් 2025.01.19 වන දින අළුයම් කාලයේදී මෝදර පොලිස් වසමේ මෝදර බෝගහවත්ත හන්දිය අසලදී එම කාර්යාංශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් **අයිස් ග්‍රෑම් 12 මිලිග්‍රෑම් 850 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන මෝදර පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 33 ක් වන කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

කොළඹ උතුර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යාංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාශය.

2025.01.19 වන දින දහවල් කාලයේ ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ නාගලගම් වීදිය ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාශයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 610 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙක්** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන කොළඹ 14 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. දියේ ගිලී අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ මෘතශරීරය හමුවීම - වැලිකන්ද පොලිස් වසම.

2025.01.19 වන දින රාත්‍රී කාලයේ වැලිකන්ද පොලිස් වසමේ සේනපුර මුතුගල වැවේ පිටවාන අසලදී පුද්ගලයෙකු දියේ ගසාගෙන ගොස් අතුරුදහන් වී ඇති බවට වැලිකන්ද පොලිස් ස්ථානයට ලද තොරතුරක් මත විමශර්න ආරම්භ කර ඇත.

**අතුරුදහන් වූ පුද්ගලයාගේ මෘතශරීරය 2025.01.20 වන දින දහවල් කාලයේ දී හමු වී ඇත. මරණකරු අවුරුදු 35 ක් වූ නවසේනපුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු විදෙස් ගතවීම සඳහා කොළඹ පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට සහභාගි වීමට ඔහුගේ බිරිඳ හා විදෙස් රැකියා ආයතනයේ නියෝජිතයා සමඟ යතුරුපැදියෙන් පිටව ගොස් ඇත. එලෙස ගමන් කිරීමේදී මුතුගල වැවේ පිටවානෙන් යතුරුපැදියේ ගමන් කිරීමට නොහැකි බැවින් පාගමනින් යමින් සිටියදි ජල පහරකට හසු වී දෙදෙනාම බිරිඳ ජලයේ ගසාගෙන ගොස් ඇත. ප්‍රදේශවාසින් විසින් බිරිඳ බේරාගෙන ඇති අතර මෙම පුද්ගලයා දියේ ගිලී අතුරුදහන් වී තිබිණි.

වැලිකන්ද පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**